# කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුලි 20 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 සැප්තැම්බර් 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සමඟ එකී ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ උපකල්පන පිළිබඳ සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරණු ලැබේ.

(අ) රු.130,000 ක් වටිනා ඉඩම් 03 ක වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) කිරින්ද පුහුල්වැල්ල ගම්සභා කාර්යාලය පිහිටි රු. 45,000 ක් වටිනාකම වූ පැරණි ගොඩනැගිල්ල 2013 වර්ෂයේදී කඩා ඉවත්කර තිබුණද එකී දේපල අදාල වත්කම් ගිණුමෙන් ඉවත්කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මිලට ගන්නා ලද ලීබඩු හා උපකරණවල අගය මූල්‍ය ප්‍රකාශනවල ලී බඩු හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීමේදී කැඳවූ මිල ගණන් පදනම් කරගෙන සටහන් කිරීම නිසා ලී බඩු හා උපකරණවල අගය රු.19,091 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඈ) සභාව විසින් 2014 සැප්තැම්බර් 10 දින මිලට ගෙන තිබුණු රු.3,900 ක් වූ සබ් වූෆර් යන්ත්‍රයේ වටිනාකම රු.39,000 ක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් ලීබඩු හා උපකරණ අගය රු.35,100 කින් වැඩියෙන් දැක්වුණු අතර එදිනම මිලට ගෙන තිබුණු රු.11,250 ක් වටිනාකම වූ ප්‍රොජෙක්ටර් ස්ක්‍රීන් යන්ත්‍රයේ වටිනාකම යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුමින් අත්හැරී තිබුණි.

(ඉ) සභාව විසින් 2014 ඔක්තෝබර් 26 දින පුද්ගලික ආයතනයකින් මිළදී ගෙන තිබුණු කාර්යාල මේස 5ක වටිනාකම වූ රු.71,640 ක් දෙවරක් ගිණුම්ගත වීම නිසා ලී බඩු හා සවිකිරීම්වල වටිනාකම එම අගයෙන් ද්විගණනය වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 20 දින පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබුණු අංක LL-6918 දරන ඩුම් ට්‍රක් රථයේ වටිනාකම තක්සේරු කර මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර නොතිබුණි. තවද සභාවේ මෝටර් රථ හා කරත්ත යටතේ දක්වා ඇති රු.265,000 ක් වටිනාකම වූ ට්‍රැක්ටර් ට්‍රේලරය භෞතිකව නිරීක්ෂණය නොවීය.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අත ඉතිරි මුද්දර තොගයේ වටිනාකම රු.6,262 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනවල අතැති තොගය යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ නිලධාරින් 07 දෙනෙකුගේ රු.23,262 ක් වූ සේවක ඇප මුදල් සේවක ඇප තැන්පත් යටතේ හා සේවක ඇප ආයෝජන යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද කර්මාන්ත හා ව්‍යාපාර බදුවල වටිනාකම වූ රු.412,440 ක මුදල ආදායමක් ලෙස ගිණුම්ගත නොකර, එම වටිනාකමින් වසර තුල ලැබූ රු.8,480 ක මුදල අඩුකර ඉතිරිය ණයගැතියන් යටතේ ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ සභාවේ තැන්පත් ලේඛනයට අනුව රු.26,550 ක් වටිනා ශේෂයන් පැවතියද එම ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ජංගම වෙළඳ කුටි 10 ක් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ අතර එහි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 10 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවලට අනුව ශේෂයන්ගේ එකතුව රු.6,932,801 ක් වූ අතර උපයෝගී ලේඛන අනුව හා දෙන ලද තොරතුරු අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.7,236,123 ක් වූයෙන් රු.303,322 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.305,955 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.33,421,267 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 577,478 ක් වටිනා ගිණුම් ශේෂයන් 04 ක් නිරවුල් කිරීමකින් තොරව 2006 වර්ෂයේ සිට ඉදිරියට ගෙනඑමින් පැවතුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.73,659,491 ක් වටිනා ගිණුම් විෂයයන් 07 කට අදාල කාල විශ්ලේෂණ වාර්තා, වත්කම් සමීක්ෂණ වාර්තා යනාදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) රීති 217, 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා එසේ කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අයිඒඅයි 2002/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | සභාව විසින් මිලදී ගන්නා ලද පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා ලේඛනයක් පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.412,336 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.751,256 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු. 000 | රු.000 |
| වරිපනම් හා බදු | 697 | 1,309 | 661 |
| බදුකුලී | 905 | 1,688 | 1,19 |
| බලපත්‍ර ගාස්තු | 247 | 151 | 209 |
| වෙනත් ආදායම් | 4,755 | 5,540 | 1,757 |

2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟහිටි වරිපනම් හා බදු වටිනාකම රු.576,131 ක් වූ අතර එම මුදලින් අයවීම් රු.162,065 කි. ඒ අනුව හිඟ මුදලින් අයවීමේ ප්‍රතිශතය සියයට 28 කි. සමාලෝචිත වර්ෂයට අදාල බිල්කිරීම් රු.425,989 ක් වූ අතර බිල් කිරීම් වලින් අයවීම් රු.168,825 කි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ බිල්කිරීම් වලින් ලැබීමේ ප්‍රතිශතය සියයට 40 කි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | අතිරික්ත |
|---|---|---|---|
| විධායක | 01 | 01 | - |
| ද්විතියික | 20 | 24 | 04 |
| ප්‍රාථමික | 20 | 23 | 03 |
| (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | - | 09 | 09 |
| | 41 | 57 | 16 |

භාණ්ඩාගාර ලේකම්ගේ හා මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2002 ජනවාරි 03 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 පරිදි සහ මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 පරිදි පළාත් පාලන ආයතනවල තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ වෙනයම් පදනමක් මත කරනු ලබන බඳවා ගැනීම් වහාම අත්හිටවිය යුතු බව දක්වා තිබුණද ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේදී සේවකයින් 09 දෙනෙකු බඳවා ගෙන රු.1,820,659 ක මුදලක් ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛනය අනුව වූ ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම් හා වියදම් සම්බන්ධයෙන් සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය සඵල මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බැව් නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන
---------------------
පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු  කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය